# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ
## ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම
## (ඉවත් කිරීමේ)

**2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත ඉවත් කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා විසින්
2019 මැයි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 අප්‍රේල් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[280 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්දය කිරීම (ඉවත් කිරීමේ)

එල්.ඩී.— ඕ. 14/2018

## 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්දය කිරීම පනත ඉවත් කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2019 අංක   දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්දය කිරීම (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2011 අංක 43 දරන පනත ඉවත් කිරීම.**

2. 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්දය කිරීම පනත (මෙහි මින්මතු "ඉවත් කරනු ලැබූ පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙයින් ඉවත් කරනු ලැබේ.

**සැක දුරු කිරීම.**

3. සැක දුරු කිරීම සඳහා, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින, ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය සඳහා සහ රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු වූ ඉවත් කරනු ලැබූ පනතේ I වන සහ II වන උපලේඛනයන්හි නිශ්චිතව සඳහන් ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකා රජය සඳහා සහ රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අඛණ්ඩව පැවරී තිබිය යුතු බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**ව්‍යාවර්ථන.**

4. 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්දය කිරීම පනත ඉවත් කිරීම නොතකා-

(අ) ඉවත් කරනු ලැබූ පනත යටතේ හෝ එකී පනත ප්‍රකාරව සිදුකරනු ලැබූ කොටස් නිකුත් කිරීම සහ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, අවබෝධතා ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජිකත්ව

ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළව හෝ ප්‍රකාරව ලබාගන්නා ලද සියලු බලපත්‍ර, අවසරපත්‍ර සහ අනුමතයන් ඇතුලුව සියලු ක්‍රියා ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම්, අවස්ථාවෝචිත පරිදි, පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පුනරුදය කිරීමේ කාර්යය සඳහා අඛණ්ඩව වලංගුව පැවතිය යුතු අතර, එහි නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින එකී ඌන ක්‍රියාකාරී ව්‍යවසායන්ට හෝ ඌන උපයෝජිත වත්කම්වලට අදාළ,

(i) යම් ගොඩනැගිල්ලක් සහ එම ගොඩනැගිල්ලේ කොටස් වන යම් සවිකිරීම් හෝ උපකරණ සහ ඊට අනුබද්ධ යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් ලෙස සලකනු ලබන යමක් ඇතුළුව සියලු චංචල හෝ නිශ්චල දේපළ;

(ii) දරන ලද සියලු වගකීම්;

(iii) සියලු අයිතීන්, බලතල, වරප්‍රසාද, අධිකාරයන්, බැඳීම්, කාර්යයන් සහ සම්බන්ධකම්;

(iv) සියලු පොත්, ගිණුම් සහ ලේඛන,

මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී, ඉවත් කරනු ලැබූ පනතේ විධිවිධාන යටතේ හෝ ප්‍රකාරව, එය පවරන ලද්දේ හෝ සතු ව පැවතියේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගේ චංචල හෝ නිශ්චල දේපළ, වගකීම්, අයිතීන්, බලතල, වරප්‍රසාද, අධිකාරයන්, බැඳීම්, කාර්යයන්, සම්බන්ධකම්, පොත්, ගිණුම් සහ ලේඛන ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පියවා අවසන් කර නොමැති වන්දි මුදලක් හෝ වන්දි මුදලක් සඳහා කරනු ලබන යම් ප්‍රදනයක් සඳහා වන ඉවත් කරනු ලැබූ පනත යටතේ වන යම් හිමිකම් පෑමක් හෝ ආරම්භ කරන ලද යම් පරීක්ෂණයක්, එවැනි ඉවත් කිරීමක් සිදු නොවූ පරිදි කරගෙන යා යුතු අතර, ඒ අනුව අවසන් කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.